# ‘අපට ලොක්කන් නැතුවම බැරි ද?

## පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස්’ රැගත්

**නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රකාශනය එළිදැක්වීමට සමගාමී ව 2023 මාර්තු 31 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුනු සාකච්ඡාවේ දී වැකඳවල රාහුල හිමි විසින් සිදුකළ අදහස් දැක්වීම**



> “ඇත්තටම ජනතාවට හඬක් නැහැ. ඒ හඬ අපි ගන්නම් කියනවාට වඩා, අපි ඔයාලාගේ වගකීම ගන්නම් කියනවාට වඩා අපි පීඩිත මිනිසුන්ට කියන්න ඕනි, ඕගොල්ලන්ට පුළුවන්, ඕගොල්ලෝ නැගිටින්න ඕන, ඕගොල්ලන්ට කළ හැකියි, ඕගොල්ලෝ දේශපාලනික විය යුතුයි කියල. ඔවුන් වෙත ඒ අධ්‍යාපනය අරගෙන යන්න ඕන. ඒකට මැදිහත් වෙන්න ඕනි.”

මම කැමතියි මේ සංවාදයට මේ පොත් පිංචේ තියෙන අදහසකින්ම ඇතුලු වෙන්න. මේකේ සාකච්ඡාවට ලක් කරපු කෙනෙක්ගේ අදහසක් තියෙනවා, “මහින්ද මහත්තයාට ඕන වුණා කොළඹ වගේ දියුණු කරලා එයාලාගේ උපන් ගම, එයාගේ මිනිස්සු ඉන්න තැන, එයාගේ ජීවිතය හා බැඳුණ තැන දියුණු කරන්න. ගමේ මිනිස්සුන්ට තියෙනවා තමන්ගේකම කියලා හැඟීමක්. කතාවට කියන්නේ නගරේ මිනිසුන්ගේ තෙතමනය අඩුයි. ගමේ මිනිසුන්ට උණු වෙනවා කියලා. ඒක ඇත්ත. දැන් පේන්නේ නැද්ද රනිල්, මොන තෙතමනයක් ද?” මේ මනෝභාවයත් එක්කළා මම කැමතියි සාකච්ඡාවට ප්‍රවේශ වෙන්න. එකක් මම හම්බන්තොට නිසා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉන්න කෙනෙක් නිසා. එක පැත්තකින් හම්බන්තොට දිස්ත්‍රික්කය ඇතුලේ ගොඩ නැගිච්ච විවිධ අරගලවලට සෘජුව මැදිහත්වෙච්ච කෙනෙක් විදියට මේ මනෝභාවය අපි සාකච්ඡාවට ලක් කරන එක වැදගත්. මොකද මේ මනෝභාවය ප්‍රතිපෝෂණය කරන්න පුංචි වෙලාවයි අවශ්‍ය කරන්නේ. එතකොට මේ අරගලය විසින් ගෙනාපු බොහෝ දේවල් බේදවාචකයකට යනවා නම් යන්නේ අන්න ඒ පදනමින් ඉඳලා කියන එක මගේ අත්දැකීමත් එක්ක මට හිතෙන දේ.

දැන් අපි ගත්තොත් වල්සපුගල ගොවි අරගලය. ගොවි අරගලය පටන් ගන්න අවුරුද්දකට විතර අවුරුද්දකට විතර කලින් මම අන්දරවැව ඉහත්තාවේ තියෙන එක්තරා ගෙදරකට, පියා මාමගෙ ගෙදරට යනව. පියා මාමා එක්ක මම නගිනවා උස්ගල කඳු මුදුනට. පියා මාමා ඉතාම හොඳ පරිසරවේදියෙක්. එයා ගත්තොත් ඒ දිස්ත්‍රික්කය පිළිබඳ හොඳ අවබෝධයක් තියෙන දඩයම්කරුවෙක්. එයා උස්ගල මුදුනේ ඉඳගෙන මට පෙන්නනවා වැවෙන් වැවට වතුර යන ක්‍රමය, ඒ වාරි පද්ධතියට හානි වෙලා තියෙන විදිය, ඒ වගේම මහ පරිමාණ ගොවීන් කැලේ අත්පත් කරගත්ත විදිය, ඒ වගේම මත්තල ක්‍රීඩා පිටිය, මේ මහා සංවර්ධනය ආවාම සිද්ධ වෙච්ච ක්‍රියාවලිය, අධිවේගී මාර්ග ගියාම මොන මොන අලිමංකඩවල් ද ඇහිරිලා තියෙන්නෙ කියන කාරණාව, මෙන්න මේ වගේ මහ දැනුමක් අර උස්ගල මුදුනේ ඉඳන් පියා මාමා මාත් එක්ක බෙදා ගන්නවා. මේක ලංකාදීප පුවත්පත ආවරණය කළා, පියා මාමා හොයාගෙන ගිහිල්ලා.

හැබැයි පියා මාමාට තියෙනවා හම්බන්තොට දිස්ත්‍රික්කය පිළිබඳව මනා දැනුමක්, අවබෝධයක් ගැමියෙක් විදියට. හැබැයි පියා මාමාට අවස්ථාවක් නැහැ මේ දේශපාලනික ක්‍රමය ඇතුලේ නියෝජනයක් වෙන්න. ඔහුගේ අදහස අරගෙන යන්න. ඔහුට බිම සම්බන්ධයෙන් තියෙන, ඒවගෙ'ම ඔහුට වාරි ක්‍රමය සම්බන්ධයෙන් තියෙන, ඔහුගේ ජීවිතය සම්බන්ධයෙන් ගන්න තියෙන අයිතිය, ඒ මැදිහත්වීම ගන්න ක්‍රමයක් නැහැ. ඒ වෙනුවට ගිහින් තියෙන උන් ටික ගත්තොතින් කවුද නාමල් ඉන්නවා, මහින්ද ඉන්නවා, චමල් ඉන්නවා, අජිත් රාජපක්ෂ ඉන්නවා. ඒ වගේ මහ ගොන්නක් ඉන්නවා හම්බන්තොට මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා පාර්ලිමේන්තු ආපු. යුද්ධය ඉවර වුණාම හම්බන්තොට මිනිස්සු ඇත්තටම හිතුවා මේ මනෝභාවයෙන්. කොහොමද? මහින්ද මහත්තයා ගමට ආදරෙයි, මෙහෙම වැඩ කරයි කියන මනෝභාවය වැඩි පිරිසක් අතර තිබුණා. වැඩිය නෙමේ සාමාන්‍යයෙන් අපේ ගෙදර තාත්තා වුණත් හිටියේ මේ මනෝභාවයෙන්.

මට මතකයි අපි මුලින් ජීවත් වුනේ කටුමැටි ගහපු ගෙයක. මිදෙල්ල ලෑලිවලින් තමයි අපේ දොර හදලා තිබුනේ. ඒ දොරේ හැමදාම මහින්ද මහත්තයාගේ පින්තූරයක් තිබ්බා. කුණු දූවිලිවලින් තමයි දොරේ රටා ඇඳිලා තිබුනේ නමුත් තාත්තාට හැමදාම එයාගේ ලෝකේ ලොක්කා තමයි මහින්ද මහත්තය. එයාගේ ලෝකේ කුඩු වෙන්නේ මාව අත්අඩංගුවට ගත්තාම. එතකන් ලොක්කා එයා. එවැනි මනෝභාවයකින් යුක්ත පිරිසක් ඉන්නවා. මෙහෙම අර නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා යන පිරිස් හම්බන්තොට ට ගෙනෙන සංවර්ධනය ඇතුළේ පෙරළා වෙන දේ තමයි හම්බන්තොට ජන ජීවිතය උඩුයටිකුරු වෙන එක. සූරියවැව ගොවියාගේ, ලුණුගම්වෙහෙර ඔය ආශ්‍රිත කලාපීය මිනිසුන්ගේ ජනජීවිතය උඩු යටිකුරු වෙනවා. දැන් ඔන්න අලි මිනිස් ගැටුම උග්‍රයි ඒ නිසා මිනිස්සු අලින්ට කැලයක් ඉල්ලලා අලි කළමනාකරණ රක්ෂිතයක් ඉල්ලලා උද්ඝෝෂනයක් කළා. 2001 ජනවාරි 18 වල්සපුගල වැව ආශ්‍රිතව අර පලුගස් ළග උපවාසයක් පටන් ගත්තා. දින 108 ක්. ඒ දින 108 ගතවෙච්ච හැම රාත්‍රියක්ම ගොල්ෆේස් අරගලය වගේ සමානයි. ගිනිමැල ගහගෙන, සමහර දවස්වලට කවි මඩු තියෙනවා, සමහර දවස්වලට තොවිල් තියෙනවා. සමහර දවස්වලට විදී නාට්‍ය තියෙනවා. දින 108ක් ගොවියෝ අරගල කරලා 2021 අප්‍රේල් 09 දා තමයි ගැසට් කරන්නේ අලි කළමනාකරණ රක්ෂිතය. එතකොට හම්බන්තොට ගොවි ජනතාව ගෝථාභය පැමිණිමත් එක්කලා ඒ අරගලය දැවැන්ත විදියට අරගෙන යනවා දින 108ක් ඒක නතර කරන්නේ නැතුව විවිධ බාධක හමුවේ අරගෙන යනවා.


මං කියන්නේ රටේ හැම තැනම පරිසරය වෙන්න පුළුවන්, ඒ වගේම ලියන කියන දේවල් පිළිබඳ වෙන්න පුළුවන්, ඒ වගේම දේශපාලනය කිරීමේ සමාන අයිතිය අහිමිවීම ප්‍රජාතන්ත්‍රවාදයේ එක කොටසක්. ඒ අයිතිය අහිමිවීම නිසා ඒ වෙනුවෙන් විවිධ අරගල තැන් තැන්වල පැණ නැගුණා. හැබැයි ඒ අරගලයන්ට කේන්ද්‍රයක් තිබුණේ නැහැ. ඇත්තටම අරගලයේ කේන්ද්‍රය තමයි ගොල්ෆේස් එක. ඒ හැමෝම මේ අරගලය වටා එකතු වුණා. මට මතකයි බස් පිටින් ආවා වල්සපුගල ගොවීන් මේ අරගලයට. ඇවිල්ලා හඬ නගලා කතා කළා, සටන් පාඨ කිව්වා. එතකොට මේ තමයි ගොල්ෆේස් අරගලය රට පුරාම පිරිස් තමන්ගේ දේශපාලනය කිරීමේ සමානාත්මතාවය අහිමිවීම නිසා අරගල කරන්න පෙළඹුණා. එවිට රටේ තිබුණ විවිධ තත්ත්වයන් යටතේ තමයි මේ ගොල්ෆේස් අරගලය පැන නඟින්නේ. මං හිතන්නේ ලංකා ඉතිහාසයේ ඉතා විශිෂ්ඨ අරගලයක් සහ පුරවැසියාගේ කොන්ද යම් ප්‍රමාණයකට කෙළින් කරපු අරගලයක්. මේ අරගලය පුරා විවිධ සංවාද විසංවාද තිබුණා. මේ අරගලයේ වටිනාම දේ තමයි විවිධ වෙනස්කම් තියෙන ගොඩක් මිනිස්සු එකට එක්වෙලා සාකච්ඡා කළා. පත්‍රිකාවන් හැදුවා, එකඟතාවයන්වලට ආවා. ඒ එකඟතාවයන් වෙනුවෙන් වැඩ කරන්න උත්සහ කළා. මේක ඉතා හොඳ තත්ත්වයක්. එතකොට මේ අරගලය පැන නඟින්න පෙරාතුව අපේ රටේ අරගලයට යම් කේන්ද්‍රයක් හැදෙනවා නම් ඒකට අදාළ තැන් තැන්වල විවිධ අරගලයන් තිබුණා. ඒකට හොඳ පසුබිමක් තිබුණා. ඒක විසින් තමයි අරගලය නිශ්චිත මොහොතක ගොල්ෆේස් කේන්ද්‍ර කරගෙන ඉස්මතු වෙන්නේ. එතකොට මේ අරගලයේ සාකච්ඡාවන් අතර මට මතකයි ආවා කාරණා කිහිපයක්. සංවාද දෙකක් ආවා ප්‍රධානව. එකක් තමයි මේ විවිධ වෙනස්කම් තියාගෙන කොහොම ද එකට එකතු වෙමින් සංවාද, සාකච්ඡා මැද්දේ මේ අරගලය තුළින්ම මහජන කවුන්සිලයක් නිර්මාණය කරගන්නේ කියන එක සාකච්ඡාවට ආවා. ඒ වගේම තව පැත්තකින් සාකච්ඡාවක් ආවා ඡන්දයක් ඕනි කියල. මට මතකයි ගොල්ෆේස් එකේ එක වෙලාවක රනිල් අනුප්‍රාප්තික ජනාධිපතිවරයා වෙන කොට ගොල්ෆේස් එකත් බලන් හිටියා පාර්ලිමේන්තුව දිහා. මට පෞද්ගලිකව ඒක පිළිබඳව විවේචනයක් තිබුණා. එතකොට මං හිතන්නේ මෙච්චර කාලයක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙන්න පුළුවන්, ලංකාවේ වෙන්න පුළුවන් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා සිද්ධ කරපු දේ තමයි බිමේ මිනිහාගේ ජීවත්වීමේ අයිතිය නැති කරලා දාපු එක. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය විසින් යුක්තිය යටපත් කරන ක්‍රියාවලිය තමයි අපි දැක්කේ. අර 75 වසරක් පුරාවට අපි දැක්ක කාරණය තමයි මේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ඇවිල්ලා අපේ තිබ්බ අයිතීන් අහිමි කරපු හැටි. හම්බන්තොටට අදාලව ගත්තොත් හම්බන්තොට ගොවි බිම්වල තිබුණ වතුර වලවේ වම් ඉවුරේ වතුර ටික මහ පරිමාණ ගොවියෝ පැහැර ගත්තා. ඒවගේම කැලෑ ටික අල්ල ගත්තා. වල්සපුගල තෘණ භූමිය පස්වලට කැපුවා, අනවසරයෙන් අල්ලා ගත්තා. පස්සේදී ඒ සතුන් කැලෑවට අතහරින්න සිද්ධ වෙනවා. කැලෑවට දාන්න කියලා රජයම කියනවා. එතකොට හැම වේලාවේම කළේ මිනිහාගේ බිමේ තියෙන අයිතිය, ජීවත්වීමේ අයිතිය, තියෙන ජීවන

තත්ත්වයන් තවදුරටත් නඟා සිටුවනවා වෙනුවට ඒ අයිතීන් කප්පාදු කරන ක්‍රියාවලිය තමයි නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා සිද්ධ වුනේ. එතකොට මේකට දැවැන්ත අභියෝග යක් කරපු තැනක් තමයි ගොල්ෆෙස් අරගලය කියන්නේ. ඒක නිසා මං හිතනවා ගොල්ෆෙස් අරගලයේ අර තිබුණ වෙනස්කම් මතම මහජන කවුන්සිලයක් කියන එකක් නිර්මාණය කරගන්න පුළුවන් වුණා නම් කියල. එහෙමනම් මිනිසුන්ව මර්ධනය කරන ක්‍රියාවලියට යම් උත්තරයක් ජන බලය විසින්ම ගොඩනගා ගන්න තිබුණා කියන එක තමයි මගේ අදහස. දැන් ඔවුන් යම් ප්‍රමාණයකට ශක්තිමත්ව මේ වැඩේ කරමින් ඉන්නවා. ඡන්ද කතාවක් ආවා හැබැයි ඡන්දය දෙන්නෙත් නැහැ.

සාමාන්‍යයෙන් වලසපුගල ගොවි අරගලය ගත්තත් විවිධ පාර්ශවයන් එකට එකතු වෙමින් බිමේ යුක්තිය වෙනුවෙන් හඬ නැගුවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේම කන්දක් තිබුණා මහින්දලාගේ ගෙවල් ළඟ. මහින්දගේ ආසනේ ගැටමාන්නේ, අම්මලාගේ ගෙවල් ළඟ, රිලාගලයාය කන්ද කියලා කන්දක් තිබුණා. අධිවේගී මාර්ගය හදන්න කිලෝමීටර් 10 ක් කන්ද කඩන්න මාගා ආයතනයට වෙන් වුණා. මේ රිලාගලයාය කියන සාමාන්‍යයෙන් මාතර දිස්ත්‍රික්තයත්, හම්බන්තොට දිස්ත්‍රික්කයත් අතර තෙත් බොඩරයක්, ඇත්තටම ජල පෝෂිතයක්. මේ ජලපෝෂිතය කඩන්න උත්සහ කළා. ඒ වෙලාවේ දී මොකද කළේ මහින්දගේ ශාඛා සමිතිවල හිටපු මිනිස්සු, විවිධ පක්ෂවල ක්‍රියාධරයන්, පරිසරයට හිතවත් මිනිස්සු ඔක්කොම එකතු වෙලා කිව්වා මේක කඩන්න දෙන්නේ නැහැ කියලා. එක වෙලාවක තරුණයෙක් පැහැර ගෙන කැලයට ගිහින් දැම්මා. එත් කිව්වා මේක කඩන්න දෙන්නේ නැහැ කියලා එක හඬින් මිනිස්සු අර පක්ෂ පාට භේද අතහැරලා මේ අරගලය එක්ක හිට ගත්තා. කඩන්න බැරි වුණා, අදටත් ඒක සුරක්ෂිතයි. හැබැයි දැන් මට තියෙන ගැටලුව තමයි මමත් ඒ අරගලයට සම්බන්ධ වුණා. ඒ අරගලය තියෙන වෙලාවේ හැමෝම කොඩිය ගහන්න ආවා. තමන්ගේ කොඩියත් අරගෙන ඇවිල්ලා විවිධ පක්ෂවල අය කොඩිය ගහන්න ආවා. කොඩිය ගහන්න ආවා විතරයි ඒ මිනිස්සු එකට බැඳලා තබන ව්‍යුහය මොකක් ද කියලා හෙව්වේ නැහැ. ඊට පස්සේ ඡන්දයක් ආවා මට මතකයි ඒ ඡන්දේදී මෙන්න මහින්දලාට වැඩ කරනවා ඒ අරගලයේ හිටපු මිනිස්සු. ඒ කන්ද කඩන්න එපා කියලා අරගල කරපු මිනිස්සු කොටසක් මට මතකයි මහින්දලාගේ කඳවුරුවල මිනිස්සු ගෝඨාභය දිනවන්න වැඩ කළා. එතකොට විවිධ පරිසර සංවිධාන වෙන්න පුළුවන්, විවිධ දේශපාලන ව්‍යුහයන් වෙන්න පුළුවන් ඒ හැමෝම අසමත් වුණා. මේ මහජනතාව දේශපාලනය කරන්න අභ්‍යාස කරන්න එද්දි මහජනතාව දේශපාලනිකව මැදිහත් වෙද්දි ඒක යම් ව්‍යුහයකට අසු කරගෙන ඔවුන් නිර්දේශපාලනිකව ඉන්න ක්‍රියාවලින් එහාට ගිහිල්ලා නිරන්තර දේශපාලන අභ්‍යාස කරන තැනකට ගැට ගහන්න බැරි වුණා. ඒ ගැට ගහන්න බැරිවීම විසින් ආපසු මොකද වුනේ ? ආපහු ගිහිල්ලා අර කඳවුරුවලම ලැගුම් ගත්තා. ඒ නිසා මම දැක්ක හම්බන්තොට දිස්ත්‍රික්කය විතරක් නෙමේ මම කියන්නේ මම සම්බන්ධ වෙච්ච බොහෝ අරගලවලදි මම දැක්ක ලක්ෂණය තමයි අපි උත්සහ කරනවා මේ සටන්වලදී ජරාසළු එක ගන්න එයින් එහාට ගිහිල්ලා උත්සහ කළේ නැහැ. හැබැවට ජනතාව එකතුකරන යම් ව්‍යුහයක් ගොඩනගන්න, ජනතාව බලය අභ්‍යාස කරන තැනකට පත්කර ගන්න අපි අසමත්වෙලා තියෙනව. ඒක නිසා දැන් ගම්වල මිනිසුන් ඡන්ද කතා ආවාම මෙහෙම එකක් කියනවා, මුන්ටත් දීලා බලමු. ඒක භයානකයි මම කියන්නේ, මුන්ටත් දීලා බලමු කියන එක. ඒ කියන්නේ දීලා බලන් ඉන්නවා කියන එකනේ. මං කියන්නේ දීලා බලන් ඉන්නවා කියන එක අතිශය භයානකයි. අපි කියන්න ඕනි ඕගොල්ලෝ වැඩේ කරන්න අපි කොන්ත්‍රාත්කරුවෝ නෙමෙයි කියන පදනමේ ඉඳලා. ඕගොල්ලෝ ආරක්ෂා කර ගන්න. දැන් අපි ගල්බොක්කයාගේ සංබපාල ආශ්‍රිත කන්දයක් කඩන එකකට මැදිහත්වීම් කළා. අපි කිව්වේ ඕගොල්ලෝ මැදිහත් වෙන්න, අපිත් එනවා කියන පදනමින්. ඕගොල්ලෝ පටන් ගන්න, ඒ නිසා මම හිතනවා අරගලය විවිධ තැන්වල තිබුණා. ඒ අරගලය කේන්ද්‍රය බවට පත්වුණා ගෝල්ෆෙස් අරගලය.

අපි දැන් කල්පනා කරන්න ඕනි දේ තමයි කොහොම ද මේ පශ්චාත් අරගල සමයේ දී නැවත අර ගුල්වලට රිංගන්න දෙනවා ද මේ මිනිස්සුව කියන එක. ඒ කියන්නේ තමන්ගේ පාක්ෂික ගුල්වලට රිංගගෙන වැඩ කරන්න දෙනවා ද, ඊට එහා ගිහිල්ලා විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් දේශපාලනය නිරන්තරව අභ්‍යාස කරන තැනකට මේ ජනතාව පොළඹවන්න ඕනි නැද්ද? එහෙම පෙළඹවීමක් අවශ්‍යයි. එහෙම පොළඹවන්නේ නැති තාක් කල් ඒ සඳහා සවිඥානික බව ගොඩ නඟන්නේ නැති තාක් කල් මං හිතන්නේ නැහැ ලෙහෙසි වෙනවා කියලා නැවත. දැන් ඕන පුංචි පුංචි ප්‍රතිපෝෂණ, අද මම හම්බන්තොට ඉඳලා ආවේ කෝච්චියේ. රනිල්ගේ ගුණ වයමින් තමයි මම ඉස්සරහ කට්ටිය කතා කරන්නේ. අපි මතක තියා ගන්න ඕනි කාරණාව තමයි මහින්ද රාජපක්ෂ කඳවුර ඇත්තටම මේ බිමේ මිනිස්සුන්ව නියෝජනය කළේ නැහැ. ඔවුන් නියෝජනය කළේ අර කියන රනිල්ලා මහින්දලා නියෝජනය කරන ධනය හිමි පැලැන්තියක්. නමුත් මහින්ද බලකඳවුර ගත්තොත් භික්ෂූන් වහන්සේලා විශාල කාර්යභාරයක් කරමින් ඉන්නවා දැන් මේ වෙනකොට. අපි ඒක තේරුම් ගන්න ඕනී. බෞද්ධ ජන විඥානයක් සහිත සමාජයක් තියෙන්නේ. කොළඹ ආශ්‍රිතව නැතිවුණාට ගම්වල ගියාම අපිට හම්බ වෙන්නේ එහෙම සමාජයක්. එතකොට භික්ෂූන් වහන්සේලා මම දන්න විදියට දැනට ඒ සඳහා සංවිධානය වෙමින් ඒ කඳවුර පෝෂණය කරමින් තිබෙනවා. එතකොට මේක අභියෝගයක්. අර මහජනතාව නැඟී සිටිමින් දේශපාලන අභ්‍යාස කරන්න හදපු ව්‍යායාමය පෙරළා දැමීමක්.

අර ඡන්ද කතාවත් එක්ක මට තේරෙන දේ තමයි ඇත්තටම එයාලා තමන්ගේ පැරණි ගුල්වලට ගිහින් ඉන්නවා. ඒ අතරේ මේ ප්‍රතිපෝෂණය සිද්ධ වෙනවා නැවත අපි හිතනවාට වැඩිය, පිටින් පේන කාරණාවට වැඩිය මම හිතනවා අපේ ජන මනස ඇතුළේ මේවා වැඩකරනවා. එතකොට පැරණි අදහස් නැවත ඉස්මතු වෙන්න ගන්නවා. අපිව මෙච්චර කාලයක් රවට්ටපු බල කඳවුර අතට නැවත බලය අතට යන ක්‍රියාවලියක් බවට පරිවර්තනය වෙනවා. ඒක නිසා මං කියන්නේ මම කලින් කියපු පියාමාමා කියන්නේ බිම ගැන ඉතාම හොඳට දන්න කෙනෙක්. එතකොට එයාට මේ දේශපාලන ක්‍රියාවලියට මැදිහත් වෙන්න ඉඩක් තියෙන්න ඕනි. ආණ්ඩුකරණයට මැදිහත් වෙන්න ඉඩක් තියෙන්න ඕනි. ඒ අවස්ථාව සකස් කරන්න ඕනි. එයාව නිරන්තර දේශපාලනය අභ්‍යාස කරන තැනකට ගෙන්නේ කොහොමද කියන සාකච්ඡාව තමයි මං හිතන්නේ වඩාත්ම වැදගත් වෙන්නේ. ඒ නිසා මේ වෙනකොට තියෙන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ප්‍රෝඩාවක් කියන එක ඉතාම පැහැදිලියි. එකේ අවශ්‍ය ගුණයන් නැහැ. ජනතාවට මැදිහත් වෙන්න බැහැ. පත් කරපු කෙනාව ආපහු ප්‍රශ්න කරන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. අජිත් රාජපක්ෂව ප්‍රශ්න කරන්න බැහැ හම්බන්තොට මිනිසුන්ට. එයාගේ ගල්කොරි බර ගාණක් තියෙනවා, දැක දැක ඉන්නවා. ඔයා මොනවා ද කරන්නේ කියලා අහන්න බැහැ. ඒ වගේ මටටමක්. නැවත අපි ගමන් කරන්නේ ඒවගේ තැනකට නම් නැවත මම හිතන්නේ ඛේදවාචකයක්. ඒ නිසා කොහොම ද මේ ජනතාව නිරන්තර දේශපාලනය කරන ව්‍යූහයකට ගොඩනගන්නේ සහ ඔවුන් වෙතට කොහොම ද මේ දේශපාලන විඥානය අරගෙන යන්නේ කියන අභියෝගය තමයි මං හිතන්නේ අපි වගේ කණ්ඩායම්වලට තියෙන්නේ. ඇත්තටම එයාලාට හඬක් නැහැ සමහර වෙලාවට. ඒ හඬ අපි ගන්නම් කියනවාට වඩා අපි ඔයාලාගේ වගකීම ගන්නම් කියනවාට වඩා පීඩිත මිනිසුන්ට අරගෙන යන්න ඕනි ඕගොල්ලන්ට පුළුවන්, ඕගොල්ලෝ නැගිටින්න ඕන, ඕගොල්ලන්ට කළ හැකියි, ඕගොල්ලෝ දේශපාලනික විය යුතුයි කියන අධ්‍යාපනය අරන් යන්න ඕනි. ඒකට මැදිහත් වෙන්න ඕනි කියන එක තමයි මගේ අදහස.



LAW & SOCIETY TRUST

**නීතිය හා සමාජ භාරය**
**අංක 03, කින්සි ටෙරස්,**
**කොළඹ 08,**
**ශ්‍රී ලංකාව**
**දුරකතන :+ 94 (0) 112684845**
**ෆැක්ස් :+ 94 (0) 112686843**
**admin@lstlanka.org**
**www.lstlanka.org**